සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 01

**EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES**

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

කාලය : පැය එකයි

විභාග අංකය : ................................

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |


**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**


**පහත දී ඇති වචන සමග වඩාත් ම ගැළපෙන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ප්‍රවෘත්ති
ශ්‍රව්‍ය දෘශ්‍ය
විනෝදය

(i)




(ii)


(iii)



02. මුවහත්
මුලුතැන්ගෙය
කැපීම


(i)



(ii)



(iii)



**රටාව අනුව ඊළඟ රූපය තෝරන්න.**


03.

.....................................


(i)



(ii)


(iii)


04.

.....................................


(i)


(ii)


(iii)

**අංක 05 සහ 06 ප්‍රශ්නවලට දී ඇති කවිය ඇසුරින් පිළිතුරු තෝරන්න.**

.......................... මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි
අඹ රඹුටන් ජම්බු ඉදිලා
අද හැම තැන හරි හැඩයි

05. හිස්තැනට ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
(i) ඉද්ද (ii) ඇසළ (iii) ඇහැළ


06. කවියේ සඳහන් පලතුරු ගණන
(i) තුනකි (ii) හතරකි (iii) දෙකකි



e-kalvi.com


**අංක 07 සහ 08 ප්‍රශ්නවල සංඛ්‍යා රටාවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

07.




**i.** 8
**ii.** 7
**iii.** 9

08.




**i.** 8
**ii.** 10
**iii.** 7

**අංක 09 සහ 10 ප්‍රශ්නවල දී ඇති රූප අතරින් ඉතාම කිට්ටු සම්බන්ධතාවයක් ඇති රූප දෙක තෝරන්න.**


09.



A B C D E

**i.** A හා D  **ii.** A හා C  **iii.** C හා E

10.




A B C D E

**i.** A හා B  **ii.** C හා D  **iii.** A හා C

**අංක 11 සිට 20 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11.



රූපයෙන් $1/4$ ක් දැක්වීමට පාට කළ යුතු කොටස් ගණන කීය ද?

**i.** 4  **ii.** 2  **iii.** 3

12. අක්කා මට වඩා අවුරුදු 5 ක් වැඩිමල් ය. අක්කාගේ වයස අවුරුදු 15 වන විට මගේ වයස කීය ද?

**i.** අවුරුදු 10  **ii.** අවුරුදු 5  **iii.** අවුරුදු 20

13. ඇපල් ගෙඩියක මිල අඹ ගෙඩියක මිල මෙන් තුන් ගුණයකි. අඹ ගෙඩියක මිල රුපියල් 40 නම් ඇපල් ගෙඩියේ මිල කීය ද?

**i.** රුපියල් 100  **ii.** රුපියල් 80  **iii.** රුපියල් 120

14. ජලය ලීටර 3 කට පලතුරු යුෂ ලීටර 1ක් මිශ්‍ර කර සාදන ලද බීම ප්‍රමාණය ලීටරවලින් දක්වන්න.

**i.** ලීටර 5 **ii.** ලීටර 4 **iii.** ලීටර 3

15. පේළියකට පැළ 10 බැගින් පේළි 8 ක සිටුවීමට අවශ්‍ය පැළ ගණන කීය ද?

**i.** 80 **ii.** 108 **iii.** 800

16. පොත් 5 බැගින් දරුවන් 25 කට බෙදා දීමට අවශ්‍ය මුළු පොත් ප්‍රමාණය කොපමණ ද?

**i.** 25 **ii.** 75 **iii.** 125

17. පැතුම්ගේ උපන් දිනය පෙරේදා ය. එය සෙනසුරාදාව කි. හෙට දවස කවදා ද?

**i.** සඳුදා **ii.** බදාදා **iii.** අඟහරුවාදා

18. අඹ ගෙඩි 5ක මිල රුපියල් 100 ක් නම් අඹ ගෙඩි 03 ක මිල කීය ද?

**i.** රුපියල් 60 **ii.** රුපියල් 30 **iii.** රුපියල් 80

19. මා ළඟ මුද්දර 125 ක් ඇත. මල්ලි ළඟ මට වඩා මුද්දර 50 ක් වැඩියෙන් ඇත. අපි දෙදෙනා ම ළඟ ඇති මුද්දර ප්‍රමාණය කොපමණ ද?

**i.** 300 **ii.** 250 **iii.** 175

20. ගොවිපොළක සිටින ගවයන් ගණන 50 ක් වන අතර කුකුළන් ගණන 100 කි. එහි සිටින ගවයන් හා කුකුළන්ගේ පාද ගණන කීය ද?

**i.** 100 **ii.** 400 **iii.** 200

**දී ඇති වගුව ඇසුරින් ප්‍රශ්න අංක 21 සිට 23 දක්වා පිළිතුරු සපයන්න.**

| මාසය | විකුණු කමිස ගණන | විකුණු කලිසම් ගණන |
|---|---|---|
| ජනවාරි | 600 | 550 |
| පෙබරවාරි | 400 | 340 |

21. ජනවාරි මාසයේ විකුණු කලිසම් හා කමිස ගණන කීය ද?

**i.** 850 **ii.** 1000 **iii.** 1150

22. ජනවාරි පෙබරවාරි මාස දෙකේම විකුණු මුළු කමිස ගණන කීය ද?

**i.** 890 **ii.** 740 **iii.** 1000

23. ජනවාරි මාසයේ විකුණු කලිසම් ගණන පෙබරවාරි මාසයේ විකුණු කලිසම් ගණනට වඩා කීයක් වැඩි ද?

**i.** 210 **ii.** 250 **iii.** 110

**හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

24. ලීටරයට මිලි ලීටර 1000 කි. කිලෝග්‍රෑමයට ග්‍රෑම් ..................... කි.

**i.** 100 **ii.** 1000 **iii.** 10

25. නැගෙනහිර දිශාවට මුහුණලා සිට ගත් විට මගේ වම් අත පැත්තේ පිහිටන්නේ .................... දිශාව ය.

**i.** දකුණ **ii.** බස්නාහිර **iii.** උතුර


26. රුපියල් පහේ කාසි 2 ක් ද, දහයේ කාසි 2 ක් ද, රුපියල් දෙකේ කාසි 2 ක් ද, මා ළග ඇත. මා ළග තිබෙන මුදල .................... කි.

**i.** රුපියල් 25 **ii.** රුපියල් 34 **iii.** රුපියල් 46

27. පන්තියේ මුළු සිසුන් ගණනින් $\frac{1}{2}$ ක් පාසලට පැමිණෙන්නේ බස් රථයෙනි. බස් රථයෙන් පැමිණෙන සිසුන් ගණන 22 ක් නම් පන්තියේ සිටින මුළු සිසුන් ගණන .................... කි.

**i.** 40 **ii.** 44 **iii.** 42

28. පාසල



නිවස

පාසලේ සිට නිවසට යාමේදී නිසල් තම දකුණු අත පැත්තට හැරී ගමන් කළ වාර ගණන ........... කි.

**i.** 1 **ii.** 3 **iii.** 2

29. **A =** 20  **B =** 12  **A + B**  හි පිළිතුර වන්නේ .................. කි.

**i.** 35 **ii.** 22 **iii.** 32

**පහත දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30. අවුරුද්දේ අඩු ම දින ගණන ඇති මාසය කුමක් ද?

**i.** පෙබරවාරි **ii.** නොවැම්බර් **iii.** අප්‍රේල්

31. පස්වරු 1.30 ට කොළඹ කොටුවෙන් ගමන් ඇරඹූ දුම්රියක් පැය 3 කට පසු මහනුවරට ළඟා විය. දුම්රිය මහනුවරට ළඟා වූ වේලාව කීය ද?

**i.** පස්වරු 4.30 **ii.** පස්වරු 3.30 **iii.** පස්වරු 5.00

32. විශාලත්වය වැඩි වෙන ආකාරයට සතුන් පෙළ ගස්වා ඇති පිළිතුර වන්නේ?

**i.** පූසා, බල්ලා, එළුවා, ගවයා

**ii.** බල්ලා, ගවයා, එළුවා, පූසා

**iii.** ගවයා, පූසා, බල්ලා, එළුවා


33. තාරකට වඩා මාලක උසින් වැඩිය. නාලක තාරකට වඩා උසින් අඩුය. තිදෙනා අතරින් උසින් වැඩිම කෙනා කවුරුන් ද?

**i.** මාලක **ii.** තාරක **iii.** නාලක

34. 0 8 3 ඉලක්කම් යොදාගෙන සෑදිය හැකි කුඩාම සංඛ්‍යාව කුමක් ද?

**i.** 803 **ii.** 380 **iii.** 308


35.




නිවසේ සිට කඩයට ගොස් විහාරයට යාමට ගමන් කළ යුතු දුර කොපමණ ද?

**i.** 3**m** **ii.** 13**m** **iii.** 7**m**


36.



මෙහි ඇති සෘජුකෝණාස්‍ර ගණන කීය ද?

**i.** 3 **ii.** 4 **iii.** 5

37. **A** රිබන් පටියේ දිග කොපමණ ද?




**i.** 4**cm** **ii.** 5**cm** **iii.** 3**cm**

38. **A** හා **B** රිබන් පටි දෙකෙහිම දිගේ එකතුව කොපමණ ද?

**i.** 9**cm** **ii.** 11**cm** **iii.** 10**cm**

39. අත්තක වසා සිටි කුරුල්ලන් ගණන 9 කි. ඉන් කුරුල්ලන් 3ක් ඉගිලී ගොස් නැවත කුරුල්ලන් 5ක් අත්තෙහි වැසුවේ නම් දැන් එහි සිටින කුරුල්ලන් ගණන කීය ද?

**i.** 12 **ii.** 10 **iii.** 11

40. 11 සිට 20 දක්වා සංඛ්‍යා ලිවීමේ දී 1 ඉලක්කම කී වතාවක් ලියවේ ද?

**i.** 10 **ii.** 11 **iii.** 13

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

# ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
## පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 01

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES
පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

කාලය : පැය එකයි මි. 15

විභාග අංකය : ................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | V/II/S/CH |

**01. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දියෙහි වැටී පෙඟී දිරන කොළවලින් නගින පල් ගඳ මැඩගෙන ඉදුණු කිරල සුවඳ පැතිරෙයි. හිරු රැසින් කැකෑරෙන දිය පිසගෙන එන සුළඟ අපගේ කයත් සිතත් පිනවයි. සමහර ඔරුකාරයෝ තමන්ගේ ඔරු එගොඩ බලා යාත්‍රා කරවති. ඇතැම් ඔරුකාරයෝ ගඟ පළින් පළ නවත්වන ලද ඔරුවල හිඳගෙන තවම මාළු බාති.

i. පල් ගඳ දැනුණේ මොනවායින් ද?

........................................................................................................................................

ii. පල් ගඳ මැඩගෙන පැතිරෙන්නේ කුමන සුවඳක් ද?

........................................................................................................................................

iii. දිය කැකෑරෙන්නේ කුමකින් ද?

........................................................................................................................................

iv. ඡේදයේ සඳහන් ප්‍රාණවාචී බහුවචන නාමපදයක් ලියන්න.

........................................................................................................................................

v. පහත දී ඇති පදවලට සමාන පද ඡේදයෙන් තෝරා ලියන්න.

ඉර - ........................................ ශරීරයත් - ........................................

vi. ඡේදයේ සඳහන් සඤ්ඤක අකුරක් යෙදුණු වචනයක් ලියන්න.

........................................................................................................................................

**02. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

i. ප්‍රදර්ශනය, ප්‍රදර්ශණය, ප්‍රදර්ෂනය

ii. ආරාදනාව, ආරාදානාව, ආරාධනාව

**03. සුදුසු විරාම ලකුණු යොදන්න.**

මේ වල් අඹ ජාතියක් වගෙයි ඇටඹ කියන්නේ මේවට වෙන්න ඇති

**04. හිස්තැනට සුදුසු ක්‍රියාපදය තෝරා ලියන්න.**

i. මම දිනපතා පාසල් ............................................. (යමු/ යමි)

ii. ගොවියෝ කුඹුරට ............................................. (යති/ යයි)

**05. ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

i. ............................................. නූලයි වගේ.

ii. පරංගියා ............................................. ගියා වගේ.

**06. සමානාර්ථ පද ලියන්න.**

**i.** පුවතක් - .....................................  **ii.** ඇස් - .....................................

**07. සුදුසු යුගල පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

**i.** පුංචි ළමයි රසවත් ..................................... වලට කැමැත්තක් දක්වති.

**ii.** අපි සිංහල අවුරුදු ..................................... පිළිපදිමු.

**08. ස්ත්‍රී ලිංග නාම පද ලියන්න.**

**i.** කුරුල්ලා - .....................................

**ii.** රජතුමා - .....................................

**09. යටින් ඉරක් ඇඳි අකුරේ යොදා ඇති පිල්ලම නම් කරන්න.**

**i.** කෘමියා - .....................................

**ii.** රූපය - .....................................


**10. ඉරි ඇඳි පදයට විරුද්ධාර්ථ පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

**i.** තමරා ප්‍රශ්න සියල්ලට ..................................... ලිව්වා ය.

**ii.** රූපයට ගැළපෙන වචන තෝරා ලියන්න. ..................................... වචනය කපා හරින්න.


**11. රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ලියන්න.**

**i.**



.....................................

**ii.**



.....................................

**12. පහත දී ඇති වාක්‍යයේ සිංහල තේරුම ලියන්න.**

What is your school?

.............................................................................................................................................

**13. රූපයට ගැළපෙන දෙමළ වචනය සිංහල අකුරින් ලියන්න.**

**i.**



.....................................

**ii.**



.....................................

**14. පහත දැක්වෙන දෙමළ වාක්‍යයේ සිංහල තේරුම ලියන්න.**

**i.** நான் வெளியே போகலாமா?

.......................................................................................................................................


**15. පහත සඳහන් වාක්‍යය දෙමළ බසින් ලියන්න.**

**i.** මාගේ වයස අටයි.

.......................................................................................................................................


**පිළිතුරු සපයන්න**

**16.** ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.





. ..........................................................................................................

**17.** රූපයෙන් $\frac{1}{4}$ ක් පාට කරන්න.



**18.**



**i.** මෙම ඝන වස්තුවේ නම කුමක් ද? - ..........................................

**ii.** එහි ඇති දාර ගණන කීය ද? - ..........................................

**19.** සම්මත සංකේත යොදා ලියන්න.

**i.** කිලෝ ග්‍රෑම් 1 ග්‍රෑම් 750 - ..........................................

**ii.** මිලි ලීටර 350 - ..........................................................


**20.** රෝස මල් 565 කින් මල් 5 බැගින් වූ මල් පොකුරු සාදන ලදී.

**i.** සෑදූ පොකුරු ගණන කීය ද? ......................................

**21 .** පෙට්ටියක ඇපල් ගෙඩි 12ක් ඇත. එවැනි පෙට්ටි 5 ක ඇති ඇපල් ගෙඩි ගණන කීය ද?

..............................................................................................................................

**22.** පහත සඳහන් ඔරලෝසු මුහුණතේ දක්වා ඇති වේලාවට පැයකට පෙර වේලාව කීය ද?




..............................................................................

**23.** පොතක මිල රුපියල් 170 කි. එම මුදල නෝට්ටුවලින් පමණක් ගෙවන ආකාරය ලියා දක්වන්න.

..............................................................................................................................

**24.** රූපයේ සමමිතික රේඛා ඇඳ දක්වන්න.



**25.** **A** භාජනය පිරවීමට **B** භාජනයෙන් කී වාරයක් වතුර දැමිය යුතු ද?





**A** **B**

..............................................................................................................................

**26.** පවන් ළඟ පැන්සල් 12ක් තිබුණි. එක් අයෙකුට පැන්සල් 2 බැගින් යහළුවන් කී දෙනෙකුට ඒවා දිය හැකි ද?

..............................................................................................................................

**27.**




**i.** අන්නාසි ගෙඩියක මිල කීය ද? - ........................................

**ii.** අන්නාසි ගෙඩි 5ක මිල කීය ද? - ......................................

**28.** රැකියාවට යාමට උදෑසන 6.00ට නිවසින් පිටත් වූ තාත්තා ඉන් පැය 2කට පසු රැකියා ස්ථානයට ළඟා විය. තාත්තා රැකියා ස්ථානයට ළඟා වූ වේලාව කීය ද?

........................................................................................................................

**29.** චොක්ලට් එකක් රුපියල් 60/- කි. චොක්ලට් 2ක් මිලදී ගත් මම රු. 200/- ක් මුදලාලිට දුන්නෙමි. ඉතිරිය ලෙස මට ලැබුණු මුදල රුපියල් කීය ද?

........................................................................................................................

**අංක 30 සිට 59 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**30.** පාස්කු දිනය සමරනු ලබන්නේ,

**i.** ක්‍රිස්තියානි භක්තිකයන් **ii.** හින්දු භක්තිකයන්

**iii.** ඉස්ලාම් භක්තිකයන්

**31.** ක්‍රීඩා ක්ෂේත්‍රයේ දක්ෂතා දැක්වූ අයෙකි,

**i.** ආතර් සී ක්ලාක් **ii.** සුසන්තිකා ජයසිංහ

**iii.** ආතර් වී දියෙස්

**32.** දිගු දිව යොදා සතුන් අල්ලා ගනී,

**i.** බල්ලා **ii.** ගෙම්බා **iii.** ලේනා

**33.** මහාමාරිය රෝගය බෝ කරන සත්ත්වයා,

**i.** බළලා **ii.** මීයා **iii.** ගිරවා

**34.** පොදුවේ පරිහරණයට ගන්නා උපකරණයකි,

**i.** ඇස් කන්නාඩිය **ii.** රූපවාහිනිය **iii.** තුවාය

**35.** මිශ්‍ර ආහාර වේලක් ලබා ගැනීම නිසා,

**i.** මන්ද පෝෂණය ඇති වේ.

**ii.** කායික හා මානසික නිරෝගී බව ඇති වේ.

**iii.** නිතර ලෙඩ රෝගවලට ගොදුරු වේ.

**36.** අතීතයේ දී ජලය පිරිසිදු කර ගැනීමට භාවිත කළ ක්‍රමයක් නොවේ,

**i.** ඉඟිනි ඇට යෙදීම **ii.** උණුකර නිවා ගැනීම

**iii.** ක්ලෝරීන් යෙදීම

**37.** ආහාර අපිරිසිදු වන අවස්ථාවක් වන්නේ,

**i.** අත් සෝදා ආහාර ගැනීම ය.

**ii.** ආහාර බඳුන් වසා නොතැබීම ය.

**iii.** එළවළු වර්ග කපා සෝදා ගැනීම ය.

**38.** බීජ තවාන් කර පැළ ලබා ගන්නා බෝගයකි,

**i.** මඤ්ඤොක්කා **ii.** කෙසෙල්

**iii.** මිරිස්

**39.** 'කිරි කොරහා නැටුම' චාරිත්‍රය සිදු කරන්නේ,

**i.** දෙමළ ජනාතාව **ii.** සිංහල ජනතාව **iii.** වැදි ජනතාව

**40.** රියදුරන් තුළ දැකිය හැකි අයහපත් හැසිරීමකි,

**i.** තමාට නියමිත මං තීරුවේ වාහනය පැදවීම

**ii.** වාහනයේ නළාව අධික ශබ්දයෙන් හැඬවීම

**iii.** මාර්ග සංඥාවලට අනුකූලව රිය පැදවීම

**41.** වර්තමානයේ දරුවන් අතර දැකිය හැකි බෝ නොවන රෝගයකි,

**i.** සෙම්ප්‍රතිශ්‍යාව **ii.** දියවැඩියාව

**iii.** ඩෙංගු උණ රෝගය

**42.** පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි වැදගත් ලිඛිත මූලාශ්‍රයකි,

**i.** පැමිණීමේ නාම ලේඛනය **ii.** පන්ති වාර්තා පොත

**iii.** ලොග් සටහන් පොත

**43.** අප විසින් ආහාර මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවේ,

**i.** ඇසුරුමේ විශාලත්වය **ii.** නිෂ්පාදිත දිනය **iii.** කල් ඉකුත් වන දිනය

**44.** සතුන්ගේ පැවැත්මට හානිකර මිනිස් ක්‍රියාකාරකමකි,

**i.** වන වගා කිරීම **ii.** කැලෑ එළි කිරීම

**iii.** සතුන්ට ආහාර ලබා දීම

**45.** ජාතික කොඩියේ රතු පැහැති පසුබිමින් නිරූපණය වන්නේ,

**i.** සිංහල ජාතිය

**ii.** සිංහල ජාතියේ අභිමානවත් බව

**iii.** ජාතික අභිමානය

**46.** පස බුරුල් කිරීමට ගන්නා උපකරණය වන්නේ,

**i.** සවල **ii.** මුල්ලුව

**iii.** පෝරු ලෑල්ල

**47.** සකස් කළ බීම බෝතල්වල ඇති ලේබලයේ කොළ පැහැති රවුමෙන් අදහස් වන්නේ,

**i.** සීනි අඩු ප්‍රමාණයක් ඇති බවය

**ii.** අධික සීනි සහිත බවය

**iii.** මධ්‍යම සීනි ප්‍රමාණයක් ඇති බවය

**48.** කඩදාසියක සිදුරු විදීම සඳහා භාවිත කරයි.

**i.** පංචරය **ii.** ස්ටෙප්ලරය

**iii.** කතුර

**49.** හැඩයෙන් සමාන පත්‍ර ඇති ශාක වර්ග 2 කි,

**i.** සේර, පේර **ii.** බුලත්, ගම්මිරිස්

**iii.** ගස්ලබු, කොස්

**50.** මැයි මාසයේ පවත්වනු ලබන උත්සවයකි,

**i.** පොසොන් උත්සවය **ii.** නත්තල් උත්සවය **iii.** වෙසක් උත්සවය

**51.** ජලය මගින් ව්‍යාප්ත වන බෝගයක් නොවේ,

**i.** කදුරු **ii.** පොල් **iii.** හොර

**52.** පරිසරයේ සුළං හමන දිශාව හඳුනා ගත හැකි ක්‍රමයක් නොවේ,

**i.** හඳුන් කූරක් දල්වා දුම් යන දිශාව අනුව **ii.** ගංගාවක ජලය ගලන දිශාව අනුව

**iii.** කොඩියක් ලෙළ දෙන දිශාව අනුව

**53.** මාර්ග ආලෝක සංඥා පුවරුවක ඇති වර්ණ පිළිවෙළින්,

**i.** කොළ, රතු, කහ **ii.** රතු, කොළ, කහ

**iii.** රතු, කහ, කොළ

**54.** ඉස්ලාම් භක්තිකයන්ගේ ආගමික සිද්ධස්ථානය හඳුන්වන්නේ,

**i.** පල්ලිය **ii.** මස්ජිදය **iii.** කෝවිල

**55.** විදුලිය තිබේදැයි පරීක්ෂා කිරීමට යොදා ගන්නා උපකරණය,

**i.** අඬුව **ii.** ටෙස්ටරය

**iii.** නියන

**56.** ශක්තිය වඩවන ආහාර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

**i.** මාළු, බත්, පලතුරු

**ii.** බත්, මඤ්ඤොක්කා, කොස්

**iii.** ගොටුකොළ, මාළු, මුංඇට

**57.** පෙති 4ක් ඇති මල් වර්ගයකි,

**i.** ඇන්තූරියම් **ii.** නා මල

**iii.** කඩුපුල්

**58.** ඇස හා කන මූලික කරගෙන තොරතුරු ලබා දෙන මාධ්‍යයකි,

**i.** රූපවාහිනිය **ii.** ගුවන් විදුලිය **iii.** පුවත්පත

**59.** ලීයක් සුමට කිරීමට යොදා ගන්නා උපකරණය වන්නේ,

**i.** නියන **ii.** යතු කැටය **iii.** කියත

**60.** "උදෑසන අසිරිය" යන මාතෘකාව යටතේ උක්ත ආඛ්‍යාත සම්බන්ධය අක්ෂර වින්‍යාසය නිවැරදි වාක්‍ය 03 ක් ලියන්න. සෑම වාක්‍යයක් ම වචන 04කට නොඅඩු විය යුතුය.

- ..........................................................................................................

..........................................................................................................

- ..........................................................................................................

..........................................................................................................

- ..........................................................................................................

..........................................................................................................

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර
පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | ii | 16. | iii | 31. | i |
| 02. | ii | 17. | i | 32. | i |
| 03. | iii | 18. | i | 33. | i |
| 04. | ii | 19. | i | 34. | iii |
| 05. | iii | 20. | ii | 35. | ii |
| 06. | i | 21. | iii | 36. | iii |
| 07. | iii | 22. | iii | 37. | i |
| 08. | iii | 23. | i | 38. | iii |
| 09. | ii | 24. | ii | 39. | iii |
| 10. | iii | 25. | iii | 40. | ii |
| 11. | ii | 26. | ii | | |
| 12. | i | 27. | ii | | |
| 13. | iii | 28. | iii | | |
| 14. | ii | 29. | iii | | |
| 15. | i | 30. | i | | |

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර
පිළිතුරු පත්‍රය - II පත්‍රය

01. i. දියෙහි වැටී පෙඟී දිරන කොළවලින්
ii. ඉදුණු කිරල සුවඳ
iii. හිරු රැසින්
iv. ඔරුකාරයෝ
v. හිරු, කයත්
vi. ගඳ, මැඩගෙන, සුළඟ, ගඟ, සුවඳ (ලකුණු 1 x 7 = 7)

02. i. ප්‍රදර්ශනය
ii. ආරාධනාව (ලකුණු 1 x 2 = 2)

03. "මේ, වල් අඹ ජාතියක් වගෙයි. ඇටඹ කියන්නේ මේවට වෙන්ඩ ඇති." (ලකුණු 1 x 2 = 2)

04. i. යම්
ii. යති (ලකුණු 1 x 2 = 2)

05. i. ඉඳිකටුවයි
ii. කෝට්ටේ (ලකුණු 1 x 2 = 2)

06. i. ප්‍රවෘත්තියක්
ii. නෙත් (ලකුණු 1 x 2 = 2)

07. i. කෑම බීම
ii. සිරිත් විරිත් (ලකුණු 1 x 2 = 2)

08. i. කිරිල්ලී
ii. රැපීන (ලකුණු 1 x 2 = 2)

09. i. ගැට ඇලපිල්ල
ii. දික් ඇද පාපිල්ල (ලකුණු 1 x 2 = 2)

10. i. පිළිතුරු
ii. නොගැළපෙන (ලකුණු 1 x 2 = 2)

11. i. Train
ii. Kite (ලකුණු 1 x 2 = 2)


12. i. ඔබගේ පාසල කුමක් ද? (ලකුණු 1)

13. i. මාමි පළමි
ii. අලරිප්පු (ලකුණු 1 x 2 = 2)

14. මම එළියට යන්න ද? (ලකුණු 1)

15. එනදු වයදු එට්ටු (ලකුණු 1)

16. තුන්සිය හය (ලකුණු 1)

17. 

ඕනම කොටස් තුනක් පාට කර තිබිය යුතුයි. (ලකුණු 1)

18. i. චතුස්තලය
ii. 6 යි (ලකුණු 1 x 2 = 2)

19. i. 1 kg 750 g
ii. 350 *ml* (ලකුණු 1 x 2 = 2)


20. 113 යි (ලකුණු 1)

21. 60 යි (ලකුණු 1)

22. වෙලාව 2 යි (ලකුණු 1)

23.
- රුපියල් 100 + රුපියල් 50 + රුපියල් 20
- රුපියල් 50 + රුපියල් 50 + රුපියල් 50 + රුපියල් 20
- රුපියල් 50 + රුපියල් 20 + රුපියල් 20 + රුපියල් 20 + රුපියල් 20 + රුපියල් 20 + රුපියල් 20

(ලකුණු 1)

24. 

(ලකුණු 1)

25. පස් වාරයක් (ලකුණු 1)

26. හය දෙනෙකුට (ලකුණු 1)

27. i. රුපියල් 80 යි
ii. රුපියල් 400 යි
(ලකුණු 1 x 2 = 2)

28. උදෑසන 8.00 යි (ලකුණු 1)

29. රුපියල් 80 යි (ලකුණු 1)

30. i (ලකුණු 1½)

31. ii (ලකුණු 1½)

32. ii (ලකුණු 1½)

33. ii (ලකුණු 1½)

34. ii (ලකුණු 1½)

35. ii (ලකුණු 1½)

36. iii (ලකුණු 1½)

37. ii (ලකුණු 1½)

38. iii (ලකුණු 1½)

39. iii (ලකුණු 1½)

40. ii (ලකුණු 1½)

41. ii (ලකුණු 1½)

42. iii (ලකුණු 1½)

43. i (ලකුණු 1½)

44. ii (ලකුණු 1½)

45. iii (ලකුණු 1½)

46. ii (ලකුණු 1½)

47. i (ලකුණු 1½)

48. i (ලකුණු 1½)

49. ii (ලකුණු 1½)

50. iii (ලකුණු 1½)

51. iii (ලකුණු 1½)

52. ii (ලකුණු 1½)

53. iii (ලකුණු 1½)

54. ii (ලකුණු 1½)

55. ii (ලකුණු 1½)

56. ii (ලකුණු 1½)

57. ii (ලකුණු 1½)

58. i (ලකුණු 1½)

59. ii (ලකුණු 1½)

60. අක්ෂර වින්‍යාසය නිවැරදිව
උක්ත අක්‍යාත සම්බන්ධය නිවැරදිව
වචන 4කට නොඅඩු නිර්මාණාත්මක
වැකි ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(නිවැරදිව ලියා ඇති වාක්‍යයට
ලකුණු 2 බැගින් - ලකුණු 2 x 3 = 2)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education – Western Province**

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 02

**EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES**

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

කාලය : පැය එකයි

විභාග අංකය : ................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | |
| | V/II/S/CH |

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(1) මුලින් දී ඇති චිත්‍රයට සමාන නොවන සේ ඇඳ ඇති චිත්‍රය තෝරන්න.




(1) (2) (3)

(2) මුලින් දී ඇති රූපයට සමාන රූපය තෝරා යටින් ඉරක් අඳින්න



(1) (2) (3)

(3) පළමු රූපයට වඩාත් ගැළපෙන රූපය ඉතිරි රූප තුනෙන් තෝරන්න.




(1) (2) (3)


(4) ඉරි ඇඳි පදවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න

ඇය දුන් තිළිණය කදිම එකකි.

(1) කාඩ්පත, අපූරු (2) මුදල , වටිනා (3) තෑග්ග, අපූරු

(5) රූපයේ ඉවත් කළ කොටස තෝරන්න






(1) (2) (3)




e-kalvi.com

විභාග අංකය: ..............................

(6) හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න




පින්තූර ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(7) සොබා දහමේ නිර්මාණ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) A,J,D,F (2) A,J,D,G (3) E,I,D,F

(8) වැඩ පහසු කරන උපකරණ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) H,I (2) C,F (3) I, J

(9) මෙම රූපවලින් පෙන්වා ඇති ද්‍රව්‍ය කාණ්ඩ දෙකකට වෙන් කළ හැක.
එම කාණ්ඩ දෙක නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.




(1) A B සහ C D (2) A C හා B D (3) A D හා B C

(10) හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

ගවුමට: රෙදි නම් ඉදලට .........................

(1) ඉරටු (2) කොහු (3) තල් අතු

(11) මේ කවියෙන් කියවෙන්නේ කුමක් ගැනද?

නිවී නිවී යළි දැල්වෙන
චමත්කාර රටා මවන
පාට පාට එළි විහිදන
නිශා අහස හැඩ කරවන

(1) තොරණක් ගැන ය. (2) රෑ අහස ගැන ය. (3) තරු රටා ගැන ය.

(12) නුවන් හා පවන් සම වයස් යහළුවන් දෙදෙනෙකි.ඔවුන් ගමන් බිමන් යන්නේද,පාසල් යන්නේ ද සෙල්ලම් කරන්නේ ද එකටම ය.මේ හා සැසඳෙන ප්‍රස්තාව පිරුළ වන්නේ,

(1) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ (2) ඉදි කටුවයි නූලයි වගේ

(3) ළිඳේ ඉන්න ගෙම්බා වගේ

**පහත ප්‍රකාශය අනුව නිවැරදි පිළිතුර තෝරන්න.**

(13) බොහෝ පක්ෂීන්ට පියාඹිය හැකිය.කුකුළාද පක්ෂියෙකි. මේ අනුව පහත නිගමනවලින් වඩාත් සත්‍ය වන්නේ,

(1) කුකුළාට රාත්‍රියට පියාඹිය හැකිය.

(2) කුකුළාගේ පාද නැමිය නොහැක.

(3) කුකුළාට පියාඹිය හැකිය.

(14) අකාරාදී පිළිවෙළ අනුව පිළිවෙළින් නම් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) කමල්, ගාමිණී, ඩයනා, ජනක, තමරා

(2) කමල්, ගාමිණී, තමරා, ඩයනා, ජානක

(3) කමල්, ගාමිණී, ජානක, ඩයනා, තමරා

(15) පහත සිදුවීමට හේතුවක් විය හැකි නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

පාරමී පාසල් යන විට පාසලේ ගේට්ටුව වසා තිබීම.

(1) පාරමී අවදි වීමට ප්‍රමාද වීම.

(2) උදැසන මව කෑම සැදීමට පමා වීම.

(3) පාරමී පාසල් යෑමට ප්‍රමද වීම.

**නිවැරදි පිළිතුර තෝරන්න.**

(16) එක්තරා දිනක නර්තන පුහුණුවීම් සඳහා පන්තියේ සිසු සිසුවියෝ ප්‍රධාන ශාලාවට පැමිණියහ.නීතා ශාලාවට එන විට සීතා ශාලාවට පැමිණ සිටියා ය.ගීතා පුහුණුවීම් ඇරඹීමට මොහොතකට පෙර සීතා ආවා ය.ඒ අනුව අවසානයට පැමිණියේ,

(1) නීතා (2) සීතා (3) ගීතා

(17) ¤ සංකේතය තුන්වරක් ද Δ සංකේතය එක්වරක් ද යොදාගෙන 3133 යන සංඛ්‍යාව ලියා තිබුණි. 3133 ට 200ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) ¤ Δ ¤ ¤ (2) ¤ ¤ ¤ ¤ (3) ¤ ¤ ¤ Δ

(18) 7543 සංඛ්‍යාවේ ඉලක්කම් ආරෝහණ පිළිවෙළට සකස් කළ විට සැදෙන නව සංඛ්‍යාවේ සියයස්ථානයේ ඉලක්කමෙන් නිරූපිත අගය වන්නේ,

1) 100 2) 400 3) 500

(19) දසුන්ගේ වයස සුපුන්ගේ වයසින් අර්ධයකි.සුපුන්ගේ වයස නිපුන්ගේ වයසින් අර්ධයකි.තිදෙනාගේ ම වයස්වල එකතුව අවුරුදු 63 කි.ඒ අනුව නිපුන්ගේ වයස අවුරුදු කීයද?

1) අවු.09 2) අවු.18 3) අවු.36

**පහත සඳහන් වාක්‍යවල යටින් ඉරි ඇඳ කොටස කිසියම් සිදුවීමකට හේතුවක් නම් (√) ලකුණ ද කිසියම් සිදුවීමකට හේතුවක් නොවේ නම් (×) ලකුණ ද ඒ ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

(20) අමාවක <u>**දිනය**</u> නිසා අහසේ හඳ බැබළුණි. (...............)


(21) ශ්‍රී ලංකාව <u>**මුහුදින් වට වී ඇති නිසා**</u> එය දූපතකි. (...............)

(22) නිවැරදි අනුපිළිවෙළ සහිත පිළිතුර තෝරන්න.

1) නූල සහ ඉඳිකටුව ගත්තා.
2) මල් මාලයක් හැදුවා.
3) බෝධිය වටා පැළැන්දුවා.
4) වට්ටියට මල් කැඩුවා.
5) මල් එකින් එක ඇමුණුවා.

1) 4,1,5,3,2 2) 4,5,1,3,2 3) 4,1,5,2,3

(23) මෙම රූපයේ අඳුරු නොකළ කොටස මුළු රූපයෙන් කවර භාගයක් ද?




(1) $\frac{1}{4}$ (2) $\frac{2}{4}$ (3) $\frac{3}{4}$

(24) එක්තරා මාර්ගයක මීටර 2ක පරතරයක් ඇතිව කණු 12ක් සිටවනු ලැබීය. මුල් කණුවේ සිට අවසාන කණුවට ඇති දුර කොපමණද?

1) 20m 2) 22m 3) 24m

(25) " ආහාර - ධාන්‍ය- කව්පි" යන සම්බන්ධය දැක්වෙන්නේ




(1) (2) (3)

**නිවැරදි පිළිතුර තෝරන්න.**

(26) මීටර 22ක් උස පොල් ගසකින් පොල් ගෙඩියක් බිමට වැටීමට තත්පර 12ක් ගතවේ නම්, එම ගසෙන් ම පොල්ගෙඩි 4ක් එකවර බිමට වැටීමට ගත වන කාලය කොපමණ ද?

(1) තත්පර 48 (2) තත්පර 22 (3) තත්පර 12

**රූපයේ දැක්වෙන්නේ හරි හතරැස් ලී කුට්ටියකි.එහි මතුපිට සායම් ආලේප කර ඉරි දිගේ කුඩා කැබලිවලට කපා වෙන් කරනු ලැබේ.**



(27) සායම් නොගැවුණු කුඩා ඝනක කීයක් වේද?

1) 1 2) 2 3) 3

(28) මෙහි පැති 3ක තීන්ත ගැවුණු කුඩා ඝනක කීයද?

1) 5 2) 6 3) 8


(29) වැරදි ප්‍රකාශය තෝරා එයට යටින් ඉරක් අඳින්න.

(1) 482 + 321 + 532 = 1335


(2) 359 + 378 + 598 = 1335

(3) 523 + 689 + 223 = 1335

**පහත දැක්වෙන රූප දෙස හොඳින් බලා පිළිතුරු තෝරන්න.**



රු.140.00



රු.240.00

(30) ඇපල් ගෙඩියක සහ දොඩම් ගෙඩියක මිළ කීයද?

1) රු.120.00 2) රු.100.00 3) රු.140.00

(31) ඇපල් ගෙඩි 3ක හා දොඩම් ගෙඩි 5ක මිල කීයද?

1) රු.500.00 2) රු.480.00 3) රු380.00

(32) පහත දැක්වෙන වචන ඉලක්කම්වලින් සැදුණු රහස් භාෂාවකට පෙරළා ඇත. නමුත්, මෙහි ඇති ඉලක්කම් යොදා ඇත්තේ අකුරු අනුපිළිවෙළින් නොවේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

| | | |
|---|---|---|
| MIST | RAIN | LAKE |
| 3402 | 3791 | 8569 |

I අකුර වෙනුවට යොදා ඇති ඉලක්කම කුමක්ද?

(1) 5 (2) 3 (3) 4

(33) දෙසැම්බර් 20 දින සිට අඛණ්ඩව ම සතියක් ම වැසි ඇති වුණේය.ඒ අනුව වැස්ස පැයූ දවස වන්නේ,

(1) දෙසැම්බර් 26 (2) දෙසැම්බර් 27 (3) දෙසැම්බර් 28

(34) "දොළාස්දහස් අටසිය හැත්තෑ තුන" යන සංඛ්‍යාවේ මැද ඉලක්කම එම ඉලක්කමෙන් ම ගුණ කළ විට ලැබෙන අගයෙන් අඩක් කොපමණද?

(1) 64 (2) 32 (3) 48


(35) කමල්,සුනිල්,අමල් යන තිදෙනාගේ බර එකතු කළ විට 90 kgකි. ඒ අනුව ස්ථිරවම සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) එක් අයෙකුගේ බර 30kg

(2) 30kg වඩා බර අයෙකු සිටියි.


(3) කිසිවෙකුගේ බර පිළිබඳ ව නිගමනය කළ නොහැක.

(36) හිස් තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.




(1) 21 (2) 30 (3) 31

(37) රටාව අනුව A,B හිස්තැනට සුදුසු සංඛ්‍යාව සොයන්න.




(1) 49,58 (2) 59,48 (3) 58,49

**පහත සටහන් උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 4 | 8 | 9 | 3 | 4 | 1 | 7 | 9 | 2 |
| ක | ත් | ම | ම | ර | රු | ට | ම | බ් | ක |

(38) කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර මත කතිරයක් **(×)** යොදන්න.

(39) ට අකුරට පළමුව ඇති **'ම'** අකුර උඩින් ඇති ඉලක්කම වට කර **ත්‍රිකෝණයක්** අඳින්න.

(40) ත්‍රිරෝද රථයකට පෙට්‍රල් ලීටර එකකින් 5 km ක් ගමන් කළ හැකිය.මහනුවර සිට කොළඹට යෑමට 120km දුරක් තිබේ නම්,ත්‍රිරෝද රථයට ඒ සඳහා ඉන්ධන පිරවුම්හලකින් මිල දී ගත යුතු පෙට්‍රල් ප්‍රමාණය කොපමණද?

(1) ලීටර 24 (2) ලීටර 22 (3) ලීටර 50

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 02

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

කාලය : පැය එකයි මි. 15

විභාග අංකය : ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | V/II/S/CH |

01. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඈතින් පෙනෙන රබර් හා තේ වතු පරිසරයේ අලංකාරය තවත් වැඩි කරයි. ටික දුරක් ගිය අපිට අලංකාර පැළ තවානක් ද දැක ගත හැකි විය. විවිධ තෘණ වර්ග එහි තිබෙන බව ඔරුව පදවන මාමා කීවේ ය. ඔරුව ඊළඟ තොටුපොළ අසල නතර කර, අපි පැළ තවාන වෙත ගියෙමු. අපට අවශ්‍ය තෘණ වර්ග තෝරා ගැනීම අපහසු වූයේ එහි තෘණ වර්ග රාශියක් තිබූ නිසා ය. වටිනා ඖෂධ වන තිප්පිලි, කෝමාරිකා යායක් දක්නට ලැබුණි. පැළ තවාන නැරඹූ අපි අවට සිරි නරඹා නැවත ඔරුවට ගොඩ වූයෙමු. අප නිවසට කැඳවාගෙන යාමට සීයා තිරික්කලය එවා තිබුණි.

i. මෙහි සඳහන් වන ගොඩබිම ගමන් කරන වාහනය නම් කරන්න.

.......................................................................................................

ii. අපට අවශ්‍ය තෘණ වර්ග තෝරා ගැනීම අපහසු වූයේ ඇයි?

.......................................................................................................

iii. සියලු ම අකුරුවලට පිල්ලම් යෙදුණු අකුරු හතරක වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. .......................................................................................................

iv. 'මූර්ධජ' අකුරක් හා 'සඤ්ඤක' අකුරක් එක ළඟ යෙදුණු වචනයක් සොයා ලියන්න.

.......................................................................................................

v. පරිසරයේ අලංකාරය වැඩි කරන්නේ මොනවා ද?

.......................................................................................................

vi. ඡේදයේ සඳහන් පරිදි තිප්පිලි, කෝමාරිකා යනු මොනවා ද? ..............................

(ල.6)

02. කොටුව තුළ දී ඇති වචන සහ අකුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| පනාව | බේරුවල | උ |
| ඟ | ව | ෂ |
| කුඩය | කෙසෙල් | |

i. 'ඒ' ශබ්දය සහිත පිල්ලමක් මුලට යෙදුණු වචනයකි ..........................................

ii. ආරෝහණ අක්ෂරයකි. ..........................................................................

iii. 'මූර්ධජ' අක්ෂරයකි. ..........................................................................

iv. මධ්‍ය අක්ෂරයක් අගට යෙදුණු වචනයකි. ......................................................

(ල.4)

03. දී ඇති වාක්‍ය ලිඛිත බසින් ලියන්න.

i. මල්ලී සරුංගලයක් හැදුවා.

.......................................................................................................

ii. ළමයි ගසට නැග අඹ කඩනවා.

.......................................................................................................

(ල.2)

04. දී ඇති වාක්‍යයට නිවැරදිව විරාම ලකුණු යොදන්න.

i. අක්කා මගේ උපන්දිනය ට පැන්සලක් පෑනක් සහ චිත්‍ර පොතක් තෑගි දුන්නා ය

(ල.1)

05. දී ඇති පදවල විරුද්ධාර්ථ පදය ලියන්න.

i. පරවෙනවා - ..........................................

ii. අවසානය - .......................................... (ල.2)

06. යුගල පද සම්පූර්ණ කරන්න.

i. ............................ විරිත් ii. කෙළි ........................... (ල.2)

07. සමානාර්ථ පදය ලියන්න.

i. කකුල - ..........................................

ii. හිමිදිරිය - .......................................... (ල.2)

08. දී ඇති ඒක වචන වාක්‍ය බහු වචන වාක්‍ය ලෙස සකස් කර ලියන්න.

i. ගිරවා ඇත අහසේ පියාඹයි.

.................................................................................................

ii. මම ලස්සන කතන්දරයක් කිවුවෙමි.

................................................................................................ (ල.2)

09. පහත දී ඇති වචන නිවැරදි කර නැවත ලියන්න.

i. පව්ද්ගලික - ............................................

ii. වයිරය - ............................................. (ල.2)

10. ගැළපෙන පරිදි යා කරන්න.

| | |
|---|---|
| i. නිළිය | A. බහුවචන අතීතකාල ක්‍රියා පදයකි. |
| ii. ඇත්තු | B. ස්ත්‍රීලිංග ඒකවචන නාම පදයකි. |
| iii. නටති | C. බහුවචන පුරුෂලිංග නාමපදයකි. |
| iv. කැඩුවෝ ය | D. වර්තමාන කාල බහුවචන ක්‍රියා පදයකි. (ල.4) |

11. දී ඇති සිංහල වචනයෙහි අදහස දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.


i. නැන්දා - ................................................

ii. බැංකුව - ................................................ (ල.2)

12. පහත දෙමළ වචන සඳහා යෙදෙන සිංහල වචන ලියන්න.

කාල් කළුවුංගල් - ...................................................................... (ල.1)

13. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචන ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i. 

ii. 

(ල.2)

.......................................... ......................................

විභාග අංකය - ................................

14. දී ඇති වැකියේ අදහස සිංහලෙන් ලියන්න.

i. I have a trunk - .................................................................... (ල.1)

15. "ගඟ උතුරා ගංවතුර ගැලූ දා" යන මාතෘකාව යටතේ අර්ථවත් වැකි තුනක් ලියන්න. වැකියක් වචන පහක් හෝ ඊට වැඩි විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුයි.

i. ....................................................................................................

....................................................................................................

ii. ....................................................................................................

....................................................................................................

iii. ....................................................................................................

....................................................................................................

(ල.6)

16. 8099 යන සංඛ්‍යාවට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

....................................................................................................

17. පහත සංඛ්‍යාව ස්ථානීය අගය අනුව විහිදුවා ලියන්න.

9246 - ....................................................................................

18. දහයස්ථානයේ 0, දහසස්ථානයේ 5, එකස්ථානයේ 8 සහ සියස්ථානයේ 4 වන ලෙස ඉලක්කම් පිහිටි විට ලැබෙන සංඛ්‍යාව කුමක් ද? ....................................................

19. කොටුව තුළ ඇති ඉලක්කම් යොදාගෙන සෑදිය හැකි විශාල ම සංඛ්‍යාවේ සහ කුඩා ම සංඛ්‍යාවේ එකතුව කීය ද?

| |
|---|
| 9<br>2<br>4 |

....................................................................................

20. පැළ තවාන් දෙකක තිබූ පැළ වර්ග ප්‍රමාණ පහත සටහනේ දැක්වේ.

| පැළ තවානේ නම | කොස් පැළ | රඹුටන් පැළ |
|---|---|---|
| A | 673 | 820 |
| B | 506 | 985 |

i. B තවානේ ඇති කොස් පැළ හා රඹුටන් පැළවල එකතුව කීය ද?

....................................................................................

ii. B තවානේ ඇති කොස් පැළ ගණනට වඩා A තවානේ ඇති කොස් පැළ ගණන කොපමණ වැඩි ද? ............................................................................


21. පහත සංඛ්‍යා රටාවේ හිස්තැනට ආ යුතු සංඛ්‍යා ලියන්න.

..............., ...................., 18 , 22 , 26

22. පන්තියක ළමුන් 38 දෙනෙක් සිටී. ඔවුන් සියලු ම දෙනාට පොත් 4 බැගින් ලබා දීමට අවශ්‍ය පොත් ප්‍රමාණය කොපමණ ද? ..................................................................

23. ඇපල් ගෙඩි 843 ක් පෙට්ටි 3 ක අසුරන ලදී. එක් පෙට්ටියක ඇති ඇපල් ගෙඩි ගණන කීය ද? ........................................................................................................

24. පහත රූපයේ දැක්වෙන පැන්සලේ දිග කොපමණ ද?




.......................................cm

25. පහත දැක්වෙන සෘජුකෝණාස්‍රයේ සමමිතික අක්ෂ 2 ක් අඳින්න.



26. සනකාභයක ඇති ශීර්ෂ ගණන සහ දාර ගණන ලියන්න.


ශීර්ෂ ගණන - ................................ දාර ගණන - ................................

27. මීටර් 28 සෙන්ටි මීටර 65 ක් දිග තාප්පයක මීටර් 13 සෙන්ටි මීටර 70 ක් ඉදිකර අවසන් වී ඇත. තාප්පය සම්පූර්ණ කිරීමට තව කොපමණ ප්‍රමාණයක් ඉදි කළ යුතු ද?

..........................................................................................................................

28. පරිප්පු 38 kg ක් තිබූ ගෝනියකට තවත් පරිප්පු 9 kg 350 g ක ප්‍රමාණයක් දමන ලදී. දැන් ගෝනියේ ඇති මුළු පරිප්පු ප්‍රමාණය කොපමණ ද? .....................................................

29. අඳුරු කර ඇති කොටස මුළු රූපයේ භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.............................................................................

30. පහත දී ඇති මිල දර්ශනය සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | 1 kg ක මිල රු. | ප්‍රමාණය | මුදල රු. |
|---|---|---|---|
| සීනි | 250.00 | 250 g | i. ...................... |
| පරිප්පු | ii. ...................... | 500 g | 130.00 |
| හාල් | 210.00 | 3 kg | iii. ...................... |
| එකතුව | | | iv. ...................... |

(ල.2 x 15)

ප්‍රශ්න අංක 31 සිට 60 දක්වා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

31. සූර්ය නමස්කාරය ක්‍රියාකාරකම කිරීමෙන් බලාපොරොත්තු වන්නේ,

1. නිවැරදි ව ව්‍යායාම සිදු කිරීම ය. 2. ගුරුවරුන්ගේ උපදෙස් පිළිපැදීම ය.

3. මානසික හා කායික යහපැවැත්ම පවත්වා ගැනීම ය.

32. සිත් පහන් කිරිමේ ක්‍රියාකාරකමේ හතරවන පියවර වන්නේ,

1. උදානය 2. ප්‍රාර්ථනාව 3. අධිෂ්ඨානය

33. ජාතික කොඩියේ රතු පැහැති පසුබිමින් නිරූපණය වන්නේ,

1. සිංහල ජාතිය යි 2. ජාතික අභිමානය යි 3. කොඩියේ නිමාව යි

34. රාජ්‍ය ලාංඡනයේ සෞභාග්‍ය හා පරිපූර්ණ බව නිරූපණය වන්නේ,

1. ඉර හඳ දෙකෙන් ය 2. පුන්කලසින් ය 3. වී කරලින් ය

35. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන්නේ,

1. වලි කුකුළා 2. පරෙවියා 3. හබන් කුකුළා

36. වෙල් පෙරහැර පවත්වන්නේ කුමන ආගමිකයන් විසින් ද?

1. බෞද්ධ 2. කතෝලික 3. හින්දු

37. කාල නියමයක් නොමැති ව මල් පිපෙන ශාකයකි.

1. කෙසෙල් 2. ඇහැළ 3. රඹුටන්

38. ශාකවලින් සතුන්ට සිදුවන යහපතකි.

1. මල්වල පරාගනය සිදු කිරීම 2. ආහාර හා වාසස්ථාන ලබා දීම

3. සත්ත්ව මල මූත්‍ර පොහොර ලෙස යෙදීම

39. සමාන හැඩ ඇති ශාක පත්‍ර සහිත ශාක යුගලය තෝරන්න.

1. නිදිකුම්බා - මුරුංගා 2. මුරුංගා - කතුරුමුරුංගා 3. සියඹලා - කතුරුමුරුංගා

40. ජාතික ගීය ගායනා කරන විට අප සිටිය යුත්තේ,

1. සීරුවෙන් 2. සිත් සේ 3. පහසුවෙන්

41. ශාකයක මුල් මගින් ජලය උරා ගන්නා බව නිරීක්ෂණය කිරීමට කරනු ලබන පරීක්ෂණය සඳහා වඩාත් සුදුසු ශාකය වන්නේ,

1. කූඩලු 2. කපුරු 3. මිරිස්

42. ලේන්සුවකට මලක් මසා ගැනීමට සුදුසු මැහුම් ක්‍රමයක් වන්නේ,

1. බ්ලැන්කට් මැස්ම 2. දම්වැල් මැස්ම 3. නූල් දුවවීම

43. පෙදරේරු කර්මාන්තයේ දී යොදා ගනු ලබන උපකරණයකි.

1. ලඹය 2. වරක්කලය 3. නියන

44. අපේ ශරීරය වර්ධනයට අවශ්‍ය ආහාරයකි.

1 බත් 2. මාළු 3. පලතුරු

45. ඖෂධීය ගුණයෙන් යුතු පාන වර්ගයකි.

1. පැණි බීම 2. තේ 3. පොල්පලා

46. අනාරක්ෂිත ස්ථානයකි.


1. දුම්රිය මාර්ගයේ ගමන් කිරීම 2. අලි ඇතුන් ගමන් කරන මාර්ගය

3. ගංවතුර අවස්ථාවක දී දිය නෑමට යාම

47. බරවා රෝගය බෝ වන්නේ,

1. මදුරුවන් මගින් 2. ජලය මගින් 3. රෝග වාහක පුද්ගලයන් මගින්

48. පහත සඳහන් පරීක්ෂණය සිදු කිරීමෙන් අපට නිගමනය කළ හැකි වන්නේ,



1. ජලය රත්වන විට ද්‍රවයක් බවට පත්වන බවයි.

2. ජලය රත්වන විට ඝන බවට පත්වන බවයි.

3. ජලය නටන තෙක් රත් කිරීමේ දී වාෂ්ප වන බවයි.

49. අපි පාරේ ගමන් කරන විට,

1. පාරේ රංචු වශයෙන් ගමන් කළ යුතු ය.

2. දුරකථනය භාවිත කරමින් ගමන් කළ යුතු ය.


3. පාරේ දකුණු පැත්තෙන් ගමන් කළ යුතු ය.

50. කාබනික පොහොර භාවිතයේ වාසියකි.

1. විස රහිත ආහාර ගැනීමට හැකි වීම. 2. විස සහිත ආහාර ගැනීමට හැකි වීම

3. පස නිසරු වීම

51. පහතින් දී ඇති චුම්බක දෙක ළං කළ විට,




1. ආකර්ෂණය වේ


2. විකර්ෂණය වේ

3. කිසිවක් සිදු නොවේ

52. " ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා " මෙම කවිය,

1. ගොයම් කවියකි 2. පාරු කවියකි 3. පතල් කවියකි

53. පහත රූපයෙන් දැක්වෙන්නේ,



1. අනිලමානය 2. සුළං දිශා දර්ශකය

3. රුං පෙත්ත

54. ඌව පළාතට අයත් දිස්ත්‍රික්කයක් නොවන්නේ,

1. මොණරාගල 2. බදුල්ල 3. බණ්ඩාරවෙල

55. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ඉන්දියාවට,

1. උතුරින් ය 2. දකුණින් ය 3. නැගෙනහිරින් ය

56. ස්වාභාවික ආපදාවක් නොවන්නේ,

1. භූමිකම්පා 2. සුළි සුළං 3. යුධමය තත්ත්වයන්

57. පන්ති කාමරයේ ගුණාත්මක වෙනසක් ඇති කිරීමට අපට කළ හැකි දෙයකි.

1. පන්තිය අපවිත්‍ර කිරීම 2. අවශ්‍ය දෑ ඉවත් කිරීම

3. භාණ්ඩ හා උපකරණ නියමිත ස්ථානවල තැබීම

58. අතීතයේ දී සන්නිවේදනය සඳහා යොදා නොගත් ක්‍රමයකි,

1. කෙටි පණිවුඩ යැවීම 2. අණබෙර ගැසීම 3. කොඩි එසවීම

59. සන්නිවේදනයේ අංග තුන වන්නේ,

1. යවන්නා, ලිපිය, ලබන්නා 2. යවන්නා, මාධ්‍යය, ලබන්නා

3. යවන්නා, පණිවුඩය, ලබන්නා

60. පහත ඡායාරූපවල දැක්වෙන අයගෙන් නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස සැලකෙන්නේ කවු ද?

1. 

2. 


3. 

(ල.1 x 30)

**<u>පිළිතුරු පත්‍රය</u>**

1 පත්‍රය

1) 1
2) 3
3) 2
4) 3
5) 2
6) 2
7) 1
8) 1
9) 2
10) 1
11) 3
12) 2
13) 3
14) 3
15) 3
16) 1
17) 2
18) 2
19) 3
20) ×
21) √
22) 3
23) 3
24) 2
25) 3
26) 3
27) 1
28) 3
29) 3
30) 2
31) 3
32) 2
33) 3
34) 2
35) 3
36) 2
37) 1
38) රු
39)




40) 1

# ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර අංක 02 ii කොටස

## පිළිතුරු පත්‍රය

01. i. තිරික්කලය ii. එහි තෘණ වර්ග රාශියක් තිබූ නිසා iii. කෝමාරිකා/තිප්පිලි
    iv. ඊළඟ v. රබර් හා තේ වතු vi. වටිනා ඖෂධ/ඖෂධ
02. i. බෙරුවල ii. ව iii. ෂ iv. කුඩය
03. i. මල්ලී සරුංගලයක් සෑදුවේ ය.
    ii. ළමයි ගසට නැග අඹ කඩති.
04. අක්කා මගේ උපන්දිනයට පැන්සලක්, පෑනක් සහ චිත්‍ර පොතක් තෑගි දුන්නා ය.
05. i. පිපෙනවා ii. ආරම්භය
06. i. සිරිත් ii. සෙල්ලම්
07. i. පාදය ii. උදෑසන
08. i. ගිරවු ඇත අහසේ පියාඹති.
    ii. අපි ලස්සන කතන්දරයක් කිවුවෙමු.
09. i. පෞද්ගලික ii. වෛරය
10. i. B ii. C iii. D iv. A
11. i. මාමි ii. වංගි
12. කකුල සෝදන්න.
13. i. Flowers ii. Peacock
14. මට හොඩවැලක් ඇත./ තියෙනවා.
15. වැකි 03 - අර්ථවත් ව නිවැරදිව ලියා තිබීම.
    අතීත කාලයෙන් ලියා තිබිය යුතුයි.
16. අටදහස් එකසියය
17. 9000 + 200 + 40 + 6
18. 5408
19. 1191


20. i. 1491 ii. 167

21. 10 , 14

22. 152

23. 281

24. 5 cm

25. 

26. i. 8 ii. 12

27. මීටර 14 සෙන්ටිමීටර 95 / 14 m 95 cm

28. 47 kg 350 g

29. $^{1}/_{2}$ හෝ $^{2}/_{4}$ හෝ $^{4}/_{8}$

30. i. 62.50 ii. 260.00 iii. 630.00 iv. 822.50

31. 3

32. 2

33. 2

34. 2

35. 1

36. 3

37. 1

38. 2

39. 3

40. 1

41. 1

42. 2

43. 1

44. 2

45. 3

46. 2

47. 1

48. 3

49. 3

50. 1

51. 2

52. 1

53. 2

54. 3

55. 2

56. 3

57. 3

58. 1

59. 2

60. 2

❖ අත් අකුරු හා පැහැදිලිබව සඳහා ලකුණු 01 ක් ලබා දෙන්න.